**ශීර්ෂය 154 - ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය**
**--------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

**ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ 2018** දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත **2018** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව **ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ** මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් **2018** දෙසැම්බර් 31 දිනට **ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ** මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**--------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය** විසින් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ද මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

1.6.1 **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි අදායම් නොවන ලැබීම් රු.6,848,028 ක් අඩුවෙන් ද, වෙනත් ශුද්ධ ලැබීම් රු.**5,777,530** ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් ආදායමේ ශුද්ධ අඩුවීම රු.1,070,498 ක් විය. | **2018** නොවැම්බර් **21** දිනැති අංක **267/2018** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ හි **3.1** ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව ගිණුම් ප්‍රකාශ පිළියෙල කරන ලද අතර මේ පිළිබඳව පුහුණුවීමක් හෝ මාර්ගෝපදේශයක් නොලැබුණු හෙයින් අමාත්‍යාංශය විසින් එකතු කළ ආදායම වෙන් වශයෙනුත් වියදම් වෙන් වශයෙනුත් ගෙන රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත අංක 02 ට අනුකූල වන ලෙසට ගිණුම් පිළියෙළ කරන ලදී. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි අත්තිකාරම් ගෙවීම් රු.2,031,563 ක් අඩුවෙන් ද, රාජ්‍ය ආදායමින් ආපසු ගෙවීම් රු.1,519,987 ක් වැඩියෙන් ද දක්වා තිබීම හේතුවෙන් වියදම් රු.**511,576** ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට නිවැරදි අග්‍රිම ශේෂය රු.**2,652,258,207** විය යුතු නමුත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි ශේෂය රු.2,652,817,128 ක් ලෙස දැක්වීමෙන් රු.558,921 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයට මුදල් රෙගුලාසි 208 මඟින් ලැබුනු ප්‍රතිපාදන රු.909,880 ක් අඩුවෙන් ද, මාසික ගිණුම් සාරාංශ සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව සැසඳීම් කළ පසු අත්තිකාරම් ගිණුමේ ලැබීම් හා ගෙවීම් හි වෙනස පිළිවෙලින් රු.4,690,268 ක් හා රු.398,653 ක් ගැලපීම් නොකර සකස් කිරීම, වැය | **2018** නොවැම්බර් **21** දිනැති අංක **267/2018** දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ හි **3.1** ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව ගිණුම් ප්‍රකාශ පිළියෙල කරන ලද අතර මේ පිළිබඳව පුහුණුවීමක් හෝ මාර්ගෝපදේශයක් නොලැබුණු හෙයින් අමාත්‍යාංශය විසින් එකතු කළ ආදායම වෙන් වශයෙනුත් වියදම් වෙන් වශයෙනුත් ගෙන රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත අංක 02 ට අනුකූල වන ලෙසට ගිණුම් පිළියෙළ කරන ලදී. |

විෂයය වියදම් හි ඇතුලත් හරස් සටහන් ගෙවීම් ලෙස රු.29,376,105 ද, මුදලෙන් ලද අධිභාර ලෙස රු.769,617 ද හා හරස් සටහන් ලැබීම් ලෙස රු.33,249,060 ද වැරදි ලෙස ගැලපීම් සිදු කර ශුන්‍ය අගයක් ලබාගැනීමට කටයුතු කර තිබුණි.

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 වන දිනට ජංගම නොවන වත්කම් වටිනාකම රු.633,057,435 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආරම්භක ශේෂය රු.1,564,496,082 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.930,438,647 ක් වැඩියෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. | 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය 2018 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස සැලකිය යුතු වීම. | අමාත්‍යාංශය පෙර පැවති අමාත්‍යාංශ 3 ක ඒකාබද්ධ වී පැවති බැවින් 2017 වසරේදී වත් හඳුනා ගැනීමේ ගැටළු ඇත, 2018 වර්ෂය සියළු වත්කම් හඳුනාගෙන නැවත ව තක්සේරු කරන ලද බැවින් වත්කම් වටිනාකම වැඩි විය. |

**1.6.3 විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | නිර්දේශය | අමාත්‍යාංශයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **KJ 3853** අංක දරන වාහනය 2018 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවලදී අනතුරට පත් වී තිබුණි. ඒ සම්බන්ධව අළුත්වැඩියා වියදම් වටිනාකම හා රු.22,600 ක රක්‍ෂණ වන්දි ලැබීම් සඳහා තහවුරු කිරීමට සාක්‍ෂි ඉදිරිපත් නොවීය. තවද, මූල්‍ය ප්‍රකාශන තුළ පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ අලාභය එකතුව රු. 101,650 ක් දක්වා තිබුද, මුදල් රෙගුලාසි ප්‍රකාරව සකස් කළ යුතු අවසන් වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අලාභයට වගකිව යුතු පාර්ශවය හඳුනාගෙන අලාභය අය කර ගත් පසු මු.රෙ. 109 ප්‍රකාරව අලාභය පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය පිළියෙල කල යුතු වීම. | 2018 ඔක්තෝබර් 10 දින අනතුරට ලක්වීම සම්බන්ධයෙන් වාහනයේ රියදුරු කොහුවල පොලිස් ස්ථානය වෙත පැමිණිලි කර රියදුරු විසින් ලබා දුන් ප්‍රකාශයේ පිටපත හා අනතුරු පිළිබඳ පොලිස් වාර්තාව 2018 ඔක්තෝබර් 12 දින ඉල්ලුම් කර තිබුනද, මෙතෙක් එම ලේඛන නිකුත් කර නැත. අදාල ලේඛන ලබා ගෙන එම පරික්ෂණ කටයුතු කඩිනමින් අවසන් කිරීමට සටහන් කර ගෙන ඇත |

| | | | |
|---|---|---|---|
| (ආ) | **2018** මාර්තු මාසයේදී අනතුරට පත් **CAA -0024** අංක දරන වාහනය අළුත්වැඩියා කිරීම සඳහා රු.**105,153** හා රු. **277,321** ක් ලෙස එකතුව රු.382**,**474 ක් වැය වී තිබුණි. එසේ වුවද, රු.**277,321** ක මුදල ගරාජය වෙත ගෙවූ බවට සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | රජයේ මුදල් සම්බන්ධ සියලුම ලියවිලි හා ලිපි ගොනු යාවත්කාලින කර පවත්වා ගත යුතු වීම. | 2018 මාර්තු 08 දින අංක CAA-0024 දරණ වාහනය අනතුරට ලක් වූ අතර එමගින් වාහනයට සිදු වූ හානිය අළුත්වැඩියා කරන ලදී. අමතර කොටස් නොතිබීම නිසා අළුත්වැඩියාව අවස්ථා 02 ක දී සිදු කල අතර පළමු අළුත්වැඩියාවට අදාල වියදම් රු.277,321.00කි. මෙම ගෙවීමට අදාල තොරතුරු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් ඉල්ලා ඇත. එම තොරතුරු ලද වහාම ඉදිරිපත් කරමි. |

1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය
------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරික්ෂණය** | **නිර්දේශයෙ** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට<br>2002, 2015 හා 2017 වර්ෂවල සේවය අතහැර ගිය නිලධාරීන් 03 දෙනෙකු ගෙන් අයවිය යුතු එකතුව රු.244,924 ක් අය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ **xxiv** ජේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කර ණය අයකර ගැනීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වීම. | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරමි පවති. |

1.6.5 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**
------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| | **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හ<br>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | <u>ස්ථාවර වත්කම් ලේඛනය</u><br>ස්ථාවර වත්කම් **ලේඛනය** යාවත්කාලීන කර නොතිබුණි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටය අදාළ වන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත | භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 අනුව ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර ඇති අතර පෙර පැවති අමාත්‍යාංශ වලින් පැවරුන වාහන වලට අදාළ පොත් හා විස්තර නිසියාකාරව මෙම අංශයට ලැබී නොමැති බැවින් සම්පූර්ණ තොරතුරු ඇතුලත් කිරීමට නොහැකි වී ඇත. මෙම අංශයට මිලදී ගත |

| | | |
|---|---|---|
| | යුතු වීම. | ඡායා පිටපත් යන්ත්‍ර වල විස්තරද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පිටුවල සටහන් කර ඇත. |
| (ආ) <u>ඇප ලේඛනය</u><br>ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් වෙනුවෙන් ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාර ඇප ලේඛනයක් සකස් කර ඇත. ඇප තැබ් නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් කර ඇප තැබීමට නියමිත අනෙකුත් නිලධාරීන් ඇප තැබීමට අදාළ කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. |
| (ඇ) **<u>හානි පිළිබඳ ලේඛනය</u>**<br>හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබ ලේඛනය සකස් කර ඇති අතර වාර්තා වී ඇති රථවාහන හානි එයට ඇතුලත් කර ඇත. සතුන් ආනයනයෙන් හා වෙනත් හානි වලින් රජයට සිදුවූ පාඩු වාර්තා වී නොමැති බැවින් හානි පාඩු ලේඛනයට එය ඇතුළත් කර නොමැත. |
| (ඈ) අත්තිකාරම් ලේඛනය<br>-------------------------<br>නිලධාරීන්ගේ අත්තිකාරම් නිකුත් කිරීමේදී මුදල් ලබා ගත් නිලධාරියාගේ තනතුර, වවුචර් අංකය සහ අත්තිකාරම් පියවීමේදී වවුචර් අංකය ද අත්තිකාරම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 488 (2) ප්‍රකාරව අත්තිකාරම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. | අත්තිකාරම් ලබා ගැනීමට ඉදිරිපත් කරන වවුචර අනුව නිලධාරීන්ගේ තනතුර ආදි තොරතුරු අත්තිකාරම් ලේඛනයට ඇතුලත් කිරීමට විෂයභාර නිලධාරීට උපදෙස් දෙන ලදී. මුදල් ලබාගන්නා අවස්ථාවේදී පොදු 35 වවුචරයේ අත්සන් තබනු ලැබේ. වවුචර් අංකය මුදල් පොතේ හා ගෙවීම් වවුචරයේ සඳහන්ව ඇත. |

**1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නිරීක්ෂණය**<br>------------ | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ දැක්වීම** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව**<br>---------------------- | **අනුකූල නොවීම**<br>------------- | ------------ | ----------------------- |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>------------------------ | | | |
| මුදල් රෙගුලාසි **104** | ප්‍රාරම්භක වාර්තාව දින 7ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වුවත්, | මුදල් රෙගුලාසි ප්‍රකාරව 104(3) | අමාත්‍යතුමාට හා අමාත්‍ය කාර් මණ්ඩලයට අනුයුක්ත මෙ |

| | | | | |
|---|---|---|---|---|
| | **(3)** | විගණිත දිනය වන විට වාහන 02 කට අදාළව අනතුරු සිදුවී පිළිවෙලින් දින 353 ක් හා දින 120 ක් ගතවී ඇතත් ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රකාරව හානි සම්බන්ධයෙන් දින 7ක් ඇතුලත ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කළ යුතු වීම. | වාහන අනතුරු දෙකට අදාළ රියදුරන්ගෙන් ප්‍රකාශ ලබ ගැනීමට නොහැකිවී ඇ ඒකපාර්ශවීය පරීක්ෂණය පවත්වා වාර්තා කඩිනමි ඉදිරිපත් කරමි. |
| **(ආ)** | **මුදල් රෙගුලාසි 104 (4)** | පූර්ණ වර්තාවක් මාස 3 ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වුවත්, විගණන දින වන විට අනතුරු සිදුවීම මාස 5 ක සිට මාස 50 ක් දක්වා කාල පරාසයක් ගතවී ඇති වාහන 6 ක් සම්බන්ධව එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ වර්තාවක් මාස 3 ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වීම. | අදාළ පරීක්ෂණ අවසන් ක කඩිනමින් වාර්තා ඉදිරිප කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | දඹුල්ල කළමනාකරණ භාර ඔප්පුවේ 07 වන වගන්තියේ (අ) උප වගන්තියේ (i) වන ඡේදය | භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මත භාරයේ සියලුම අතිරික්ත ඉතුරුම් අදාළ ආයෝජනයන්හි යෙදවිය යුතු බවත්, නොඑසේ නම් රජයේ ආයෝජන මාර්ග වන භාණ්ඩාගාර බිල්පත් හෝ සුරැකුම්පත්වල පමණක් ආයෝජනය කළ යුතු බව දක්වා තිබුණද, ඊට අනුකූලව නොවී අනුමැතියකින් තොරව කළමනාකරණ භාරය විසින් රු.71,572,186 ක අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | පවත්නා නීතිරීති පිළිබඳව නිලධාරීන්ගේ දැඩි අවදානය යොමු කළ යුතු විය. | කළමනාකරණ භාර ස්ථාපනක විසින් භාර අරමුදල්වල අතිරික් මුදල් වැඩිම පො අනුපාතිකයක් ලබා දෙන රාජ බැංකුවලද ආයෝජනය කිරීම උපදෙස් නිකුත් කර ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1** **වියදම් කළමනාකරණය**

--------------------------

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ

| | **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහ දැක්වීම** |
|---|---|---|---|
| | ------------------------------ | ----------------- | -------------------------------- |
| (අ) | 2018 සිට 2020 දක්වා වර්ෂ වලදී කිරි ගවයින් 15,000 ක් ආනයනය සඳහා ගෙවිය යුතු ඇමරිකන් ඩොලර් 55,465,541ක මුළු මුදලින් සියයට 20 ක් එනම් (ඇමරිකන් ඩොලර් 11,093,108) රු.1,749,672,697 ක් | මුදල් රෙගුලාසි 94**(1)** ප්‍රකාරව ප්‍රතිපාදන ඇත්නම් විනා වැඩක්, සේවාවක් හෝ සැපයුමක් සඳහා වියදමකට හෝ බැඳීමකට නොබැඳිය යුතු වීම | කිරි ගවයින් 20,000 ක් ආනයන කිරීමේ ව්‍යාපෘතිය, ප්‍රථම අදියරෙ සාර්ථකත්වය මත දෙවන අදිය ආරම්භ කිරීමට තීරණය කර තිබූ අත ව්‍යාපෘතියේ ප්‍රථම අදියර යටතේ 201 වර්ෂයේදී ආනයනය කල දෙනු |

| | | | |
|---|---|---|---|
| | අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරු වෙත 2018 වර්ෂයේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් රාජ්‍ය ණයක් ලෙස විදේශීය බැංකුවක් හරහා ණය පදනමට ලබා ගෙන ගෙවා තිබුණි. නමුත් මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මේ සඳහා 2018 වර්ෂයට ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | | 5,000ක් සම්බන්ධව 2018.මාර්තු 2 දින ඉදිරිපත් කල විශේෂඥ කමිටුවෙ වාර්තාව අනුව දෙවන අදියර දිය කිරීම සුදුසු බව නිර්දේශ කරන ල අතර, එම නිර්දේශයන් මුද අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගෙ එකඟතාවයද මත භාණ්ඩාගාරය විසි ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්ම කිරීමට අදාළ ඇ.ඩො.**11,093,108** අත්තිකාරම් මුදල් ගිවිසුම් ප්‍රකාර නිදහස් කිරීම සිදු කොට ඇත. නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්ගෙ උපදෙස් මත **2019** වර්ෂය සඳහ ප්‍රතිපාදන සලසා ඇත. |
| (ආ) | පුනරාවර්තන වියදම් විෂයයන් 24 ක් සඳහා වෙන්කල රු.මිලියන 1,093.34 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 680.59 ක් වැය කර එනම් සියයට 6 ක සිට සියයට 86 ක් දක්වා වූ පරාසයක් තුළ ඉතිරිය රු.මිලියන 412.75 ක් විය. තවද, පුනරාවර්තන විෂයයන් 2 කට වෙන්කර තිබූ රු.මිලියන 0.72 ක මුළු ප්‍රතිපාදනයම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | 2018 වසර මැද ග්‍රාමීය ආර්ථි අමාත්‍යාංශය ධීවර හා ජලජ සම්ප සංවර්ධන අමාත්‍යාංශයට එකතුවී නිසා ගරු අමාත්‍යතුමාගේ කාර් මණ්ඩලය මෙම අංශයෙන් ඉවත්වී හේතුවෙන් ඊට අදාල පුනරාවර්තන වියදම් ඉතිරි වී ඇත. |
| (ඇ) | ප්‍රාග්ධන වියදම් යටතේ වැය විෂයන් 16 ක් සඳහා වෙන්කල රු.මිලියන 2,989.62 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,434.27 ක් වැය කර සියයට 6 ක සිට සියයට 94 ක් දක්වා වූ පරාසයක් තුළ රු.මිලියන 554.34 ක ඉතිරියක් සහ ප්‍රාග්ධන විෂයයන් 6 කට වෙන්කර තිබූ එකතුව රු.මිලියන 6.5 ක මුළු ප්‍රතිපාදනයම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | -එම- | ගරු අමාත්‍යවරයා වසර මැද දී මෙ අංශයෙන් ඉවත්වූ නිසා ඒ වෙනුවෙ වෙන් කර තිබූ ප්‍රාග්ධන ප්‍රතිපාද ඉතිරිවීමත් යන්ත්‍රෝපකරණ හා වාහ වල (විශාල) ප්‍රාග්ධන අලුත්වැඩියාවෙ ගෙවීමට සිදු නොවීමත්, කාර් මණ්ඩල පුහුණු සඳහා නිලධාරි ඉදිරිපත් නොවීමත් ප්‍රාග්ධන ප්‍රතිපාද ඉතිරිවීමට හේතු විය . |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

**පහත සඳහන් නිරීක්‍ෂණය කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම** |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිය රු. 276,548 ක් ඉක්මවා පෞද්ගලික හා රාජ්‍ය ආයතන වෙත ගෙවිය යුතු රු. 1,283,259 ක බැරකම් සඳහා එකඟවී තිබීමෙන් ප්‍රතිපාදන ඉක්මවා රු. 1,006,711 ක බැදීම් ඇති කරගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 94**(1)** ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැදීම වැළැක්වීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වීම. | බැරකම්ව අදාළ 1301,1402,1403,1409 යන වැය විෂයන්වල ප්‍රමාණවත් ප්‍රතිපාදන 2018 කෙටුම්පත් ඇස්තමේන්තුවලට ඇතුළත් කලද ඇස්තමේන්තු අනුමත වීමේදී ප්‍රතිපාදන අඩුවෙන් ලැබී තිබුණ නිසා මෙම බැරකම් ඇති වූ බව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| (අ) ක්‍රියාකාරී සැලැස්ම තුළ සෑම වැඩසටහනක් සඳහාම ඉලක්කගත කාල සීමාව ලෙස 2018 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 ලෙස දක්වා ඇති අතර එක් එක් ක්‍රියාකාරකම ආරම්භ කිරීමට සැලසුම් කල නිශ්චිත කාල වකවානු දක්වා නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වීම. | ප්‍රතිපාදන අවශ්‍ය පරිදි නියමිත කාලයට නිදහස් කර ගැනීමේ අපහසුතාවයන් නිසා එක් එක් වැඩසටහන යටතේ ඇති ක්‍රියාකාරකම් ප්‍රමුඛතා ගත කොට ක්‍රියාත්මක කිරීමට සිදුවී ඇත. එබැවින් එක් එක් ක්‍රියාකාරකම සඳහා නිශ්චිත කාලසීමාවන් සැලැස්ම තුළ අන්තර්ගත කර නැත. |
| (ආ) ක්‍රියාකාරී සැලැස්ම තුළ එක් එක් වැඩසටහන යටතේ වූ ක්‍රියාකාරකම් සඳහා වෙන් කළ ප්‍රතිපාදන ඇතුළත් කර තිබුණද, ප්‍රගති වාර්තා තුළ වැඩසටහන සඳහා දැරූ මුළු වියදම පමණක් දක්වා තිබුණි. එම නිසා එක් එක් ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රගතිය මිනුම් කළ නොහැකි බව නිරීක්‍ෂණය විය. | එක් එක් වැඩසටහන යටතේ වූ ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ප්‍රගතිය මිනුම් කළ හැකි පරිදි හා සන්සන්දනය කල හැකි පරිදි ප්‍රගති වාර්තා හා ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කළ යුතු වීම. | ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රගතිය මිනුම් කළ හැකි පරිදි ඉදිරියේදී ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ඇ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා රු.මිලියන 400 ක ප්‍රතිපාදන වෙන් කර ඇති නමුත්, ඒ යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකරකම්, ඉලක්ක නිමවුම හා මිනුම් ඒකක ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි. එබැවින් ප්‍රගති වාර්තාවේ දක්වා ඇති සත්‍ය නිමවුම නිවැරදි බව තහවුරු කර ගත නොහැකි විය. | -එම- | ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සහ නිමැවුම් පිළිබඳ අවසන් නිගමනයන්ට එළඹීම පාලනය කළ නොහැකි තත්වයන් මත රදාපවතියි. එබැවින් මෙවන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් පසුව එහි සත්‍ය නිමැවුම පිළිබඳව ප්‍රගති වාර්තාවේ දක්වා ඇති වුවද ක්‍රියාකාරී සැලසුම තුළ අපේක්ෂිත ක්‍රියාකාරකම්, ඉලක්ක නිමැවුම් හා මිණුම් ඒකක ඉදිරිපත් කිරීමේ දුෂ්කරතාවයන් පැන නැඟුණි. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය විසින් 2017 වර්ෂයට අදාළව පිළියෙල කල ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.මිලියන 39.5 ක් වටිනා ව්‍යාපෘති 05 ක් අනුමත කර තිබුණද, එම වර්ෂය අවසාන වන විට එකඳු ව්‍යාපෘතියක් හෝ ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | මේ වන විට පිටුපස රථගාල සකස් කිරීම හා අපහරණ ටැංකිය සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇත. ආරක්ෂක කැමරා සවි කිරීම, නව වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම, රැස්වීම් ශාලාවේ පඩිපෙළ ඉදි කිරීමේ කටයුතු මෙම වර්ෂය තුළ සිදු කිරීමට නියමිතය. |

## 3.3 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී අදහස් දැක්වීම |
|---|---|---|
| කොළඹ, අම්පාර හා මහනුවර දිස්ත්‍රික්කවල පිහිටි ආර්ථික මධ්‍යස්ථාන 08 ක් පරීක්ෂාවේදී, ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර මධ්‍යස්ථානය ඉදිකරන ස්ථානය නිසිපරිදි හඳුනා නොගැනීම සහ ඇගයීම් නිර්ණායක සකස් කර ඊට අනුකූලව සුදුසු අයදුම්කරුවන් විනිවිදභාවයෙන් යුතුව තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් මධ්‍යස්ථාන 06 ක් අරමුණට පටහැනිව ක්‍රියාත්මක වන බවත්, තවත් මධ්‍යස්ථානවල වැඩි කඩකාමර සංඛ්‍යාවක් වසා දමා ඇති බවත් නිරීක්ෂණය විය. | විශේෂ ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අරමුණු වූ ගොවීන්ගේ කෘෂි නිෂ්පාදන සෘජුව අලෙවිකර ගැනීම තරගකාරී මිල නිෂ්පාදකයින් සඳහා ලබා දීමත්, පාරිභෝගිකයින් සඳහා සාධාරණ මිලක් ලබාදීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගෙන ආර්ථික මධ්‍යස්ථානයන් සක්‍රීයව පවත්වාගෙන යාමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම කළ යුතු වීම. | අමාත්‍යාංශය සහ කළමනාකරණ භාරයන් සමඟ එක්ව ආර්ථි මධ්‍යස්ථාන සක්‍රීයව පවත්වාගෙ යාමට අවශ්‍ය පියවරයන් මේ ව විට ගෙන ඇත. |

**අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අම්පාර විශේෂ ආර්ථික මධ්‍යස්ථානයේ කඩ 15 කින් අගෝස්තු මාසය දක්වා මාස 3 ක සිට මාස 8 ක් දක්වා කඩකුලී රු.245,500 ක මුදලක් හිඟව පැවතිණි. | කඩ කාමරවලින් නියමිත දිනට කුලි විධිමත් ගිවිසුම්වල එළඹීම් හා නියමිත දින කුලී අයකර ගැනීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කර එය නිරන්තරයෙන් සිදුවනවාද යන්න අධීක්ෂණය කළ යුතු වීම. | අය විය යුතුව තිබූ හිඟ පවරා ගත යුතුව තිබූ ව්‍යාපාර පරිශ්‍රද පවරා ගෙන ඇත. දැනට හිස්ව පවතින ව්‍යාපාර පරිශ්‍ර ද අයදුම්පත් කැඳවා ලබා දීමට කටයුතු කරමින් පවතී. |

## 3.5 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහ දැක්වීම |
|---|---|---|---|
| (අ) | දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ සමූපකාර තොග වෙළඳ සංස්ථාව මඟින් රු.මිලියන 42.75 ක් වැය කර ඉදිකර තිබූ වර්ග අඩි 14,536 ක් වූ දෙමහල් බැංකු සංකීර්ණ ගොඩනැගිල්ල වර්ෂ 06 කට ආසන්න කාලයක සිට භාර ගැනීම හෝ භාරදීමක් සිදු නොවී අදාළ කාර්යය සඳහා යොදා නොගෙන නිශ්කාර්යව තිබූ බව භෞතික පරීක්‍ෂාවේදී නිරීක්ෂණය විය. | 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353 දරන, 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන හා 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම ගොඩනැගිල්ල විධිමත් පරිදි භා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි පවතී. |
| (ආ) | 2004 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු දියර කිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ කිරි අලෙවි සැල් 1,250 පිහිටුවීමට සැලසුම් කර තිබුණි. 2013 වර්ෂය වන විට ඉන් අලෙවි සැල් 685 ක් පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ අමාත්‍යාංශය විසින් ආරම්භ කර තිබුණි. සක්‍යතා අධ්‍යයනයකින් තොරව ආරම්භ කිරීම හේතුවෙන් මෙම අලෙවි සැල් 147 ක් පමණක් 2018 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක තත්වයේ පැවතුණි. | කිරි නිෂ්පාදනය වැඩි කිරීමට විශාල වැයක් දැරූ නමුත්, දියර කිරි පරිභෝජනය වැඩි කිරීමට අවශ්‍ය මෙම අලෙවිසැල් වැසීයාම අවම කිරීම සඳහා අමාත්‍යාංයේ සෘජු අධීක්ෂණයක් සිදුකළ යුතුවීම. | දියර කිරි පරිභෝජනය වැඩි කිරීම සඳහ ආරම්භ කළ කිරි අලෙවි සැල් වල මූල අලෙවිකිරීම සඳහා අවසර දී තිබුනේ දිය කිරි පමණක් වන අතර කිරි අලෙවියෙ පමණක් ඒවා නඩත්තු කිරීම අපහසු වි අනෙකුත් ග්‍රොසරි අයිතමයන් ද අලෙ කිරීමට අවසර දී අලෙවි සැල් දිගට පවත්වා ගෙන යාමට අවශ්‍ය පසුබි සකසන ලදි. |

## 3.6 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙළෙඳපොල මිල ස්ථායිකරණය ඇති කිරීමට මෙන්ම පසු අස්වනු හානිය අවම කිරීම සඳහා පෞද්ගලික අංශය මඟින් කළමනාකරනය කරනු ලබන ශීතාගාර 5ක් ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේදී රු.මිලියන 2,000 ක් හා 2017 වර්ෂයේ රු.මිලියන 500 ක් වශයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2016 වර්ෂයේදී කිසිදු මුදලක් වැය නොකල අතර 2017 වර්ෂය තුල රු.මිලියන 53.4 ක් වැය කර ව්‍යාපෘතියේ මූලික කාර්යයන් ඉටු කළද, නිසි පරිදි | පිරිවැය අධික ව්‍යාපෘති තාත්වික හා නිවැරදි තොරතුරු මඟින් විශේෂඥ ඥාණය යොදවා නිවැරදි සක්‍යතා අධ්‍යයන වාර්තා සැකසීමෙන් අනතුරුව හා නිසි පසුවිපරමකින් යුතු බැවින් ප්‍රතිපාදනවලින් උපරිම ඵලදාවක් ලැබෙන සේ යෙදවීමට අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම යෙදිය යුතු | එකඟ වෙමි. |

| | |
|---|---|
| ශාක්‍යතා අධ්‍යයනයක් නොකිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් ඉඩම් නොමැති වීම හේතුවෙන් 2019 අප්‍රේල් මාසය දක්වාම එම ව්‍යාපෘතිය නැවත ආරම්භ කර නොතිබුණි. | වීම. |

**3.7 විදේශ ආධාර ව්‍යාපෘති**

**පහත සඳහන් නිරීක්‍ෂණය කරනු ලැබේ.**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 පෙබරවාරි 24 වන දින සිට වසර 03 ක් සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන විශිෂ්ඨත්ව පුහුණු ප්‍රවේශය සඳහා වූ හවුල්කාරිත්ව එකඟතා ගිවිසුමකට ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හා නවසීලන්තයේ මහ කොමසාරිස්වරයා විසින් නවසීලන්ත ඩොලර් මිලියන 2.5 ක අරමුදලක් ඇති කිරීම සඳහා අත්සන් කෙරිණි. එම විදේශාධාර ගනුදෙනු විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් මඟින් කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 හි 2 ඡේදයට අනුව විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් මත විදේශාධාර ගණුදෙනු ගිණුම් තැබීම් කිරීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කළ යුතු වේ. | අදාළ නොවේ. |

**3.8 වත්කම් කළමනාකරණය**

**පහත සඳහන් නිරීක්‍ෂණය කරනු ලැබේ.**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ ලියාපදිංචි හිමිකම සහිත එක් වාහනයක් හා ලියාපදිංචි හිමිකම් නොමැති වාහන 5 ක් ද ඇතුළුව වටිනාකම රු.මිලියන 16.3 ක් වූ වාහන 06 ක් 2015 ,2016 හා 2018 වර්ෂවලදී ධාවනයෙන් ඉවත් කර නිෂ්කාර්යයව පැවතුණි. | **2009** නොවැම්බර් **13** දිනැති අංක **438** දරන හා **2003** ජනවාරි **03** දිනැති අංක **353(5)** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි **771** ප්‍රකාරව නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | අමාත්‍යාංශය යටත් තිබෙන වාහන 06ක් ධාවනයෙන් ඉවත් කර තිබෙන අතර එක් එක් වාහනය සම්බන්ධව විවිධ හේතු මත ඉදිරි කටයුතු කිරීම ප්‍රමාද වී ඇත. |

## 3.9 පාඩු හා හානි

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් භාවිතා කරන ලද අංක **KA-6702** දරන වාහනය **2012** නොවැම්බර් **06** දින රියදුරුගේ අපරීක්ෂාකාරී ධාවනය නිසා සිදු වූ වාහන අනතුරකින් පසුව අළුත්වැඩියා කිරීමට රු.736,625 ක් වැය වී තිබුණු අතර රක්ෂණ වන්දි ලෙස ලැබී තිබුණේ රු.608,420 ක් පමණි. ඒ අනුව සිදුවූ රු. 128,205 ක අලාභයෙන් ප්‍රතිශතයක් පමණක් අයකර ගැනීමට 2018 වර්ෂයේදී තීරණය කර තිබුණද, අයකර ගත යුතු ප්‍රතිශත කොපමණද යන්න තීරණය කර නොතිබුණි. 2014 වර්ෂයේදී රියදුරු සේවයෙන් ඉවත් වීමේදී රු.4,000 ක් පමණක් අයකර ගෙක ඇතත් ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි **104** ප්‍රකාරව වාර්තාව සකස් කර අනතුරෙන් වූ හානියට වගකිවයුතු පාර්ශවයෙන් අලාභ හානි අයකරගැනීමට කටයුතු කළ යුතු වීම. | මු.රෙ.104 ට අනුව සිදුකළ පරීක්ෂණයේ නිරිදේශය පරිදි අලාභය රියදුරුගෙන් අය කිරීමට කටයුතු ආරම්භ කර රු.4,000.00 ක් පමණක් අය කර ගෙන ඇත. 2014.12.01 දින සිට රියදුරුගේ සේවය අවසන් කර තිබූ බැවින් අලාභය ඉන් පසුව අය කර ගෙන නැත. ඉතිරි මුදල රියදුරුගේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙතින් අය කර ගැනීමට තීරණය කළද, ආකෘති පත්‍රය රියදුරු සම්පූර්ණ කර ඉදිරිපත් කර නොමැත. මේ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවධානය යොමු කර ඇත. |
| (ආ) | 2014 වර්ෂයේදී අනතුරට පත්වූ අංක **KA 6702** වාහනයේ අළුත්වැඩියා වියදම රු.2,123,468 ක් සම්බන්ධයෙන් ලැබුණු රු.200,443 ක වට්ටම අඩු නොකර මුළු වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල පොත්වලින් කපාහැරීම් ප්‍රකාශයේ අලාභයේ වටිනාකම ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි අලාභ වටිනාකම දැක්විය යුතු වීම. | අංක **KA- 6702** දරණ වාහනය අනතුරකට ලක් වී ඇත. එහි අලුත්වැඩියා වියදම රු.**2,123,468.** කි. රු.**200,443.50** ක වට්ටමක් ලබා දී ඇත. මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3.10 කිරි ගව ආනයන ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.10.1 නිසි අධ්‍යනයකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී කිරි නිෂ්පාදනය වැඩි කිරීමට 2006 වර්ෂයේ සකස් කර ඇති ජාතික ප්‍රතිපත්තිය හා 2007 ජුනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කඩිනමින් ක්‍රියාවට නැංවිය යුතු වැදගත් යෝජනා හතරක් අතරින් ජීව සතුන් ආනයනය කිරීම සඳහා පමණක් අවධානය යොමු කර තිබුණි. එම ආනයනයේදී සර්ම කලාපීය දේශගුණයට උචිතවන පරිදි හා රටේ පවතින සම්පත්වලින් ගවයින් පෝෂණය කිරීමට , ලෙඩ රෝගවලින් ආරක්ෂා කළ හැකි පරිදි හා අවම පිරිවැයකින් නඩත්තු කළ හැකි සතුන් වර්ග හඳුනාගෙන ආනයනය කිරීම සඳහා ආනයන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | රටේ පවතින දේශගුණයට ඔරොත්තු දෙන, පරිසරයට ගැලපෙන හා රටේ සුලබ ආහාර වලින් පෝෂණය කල හැකි කිරිගව වර්ග හඳුනාගෙන රජයේ ප්‍රතිපාදනවලින් වැඩි ඵලදාවක් ලැබෙන සතුන් ආනයනයට සුදුසු ප්‍රතිපත්තියක් සකස් කිරීමට අවධානය යොමුකළ යුතු වීම. | තොරතුරු නිරවද්‍ය නොවේ. එවන් රටවලින් කිරි ගවයින් ආනයනය කිරීම ඉතා අපහසුකාරී වන අතර රෝග සම්බන්ධයෙන් මීට වඩා දැඩි අවධානමක් ඇත |
| (ආ) | 2012 වර්ෂයේ සිට කිරි ගවයින් ආනයනය කර ඇති නමුත් ඉදිරි කටයුතු සඳහා එම සතුන් සම්බන්ධව දත්ත පද්ධතියක් සකස් කොට නිසි අධීක්ෂණයක් අමාත්‍යාංශය විසින් සිදුකොට නොතිබුණි. | දත්ත පද්ධතියක් සකස් කොට නිසි අධීක්ෂණය කල යුතු වීම. | ව්‍යාපෘතියේ අදාළ සතුන් සඳහා දත්ත පද්ධතියක් සකස් කර ඇත. |
| (ඇ) | 2017 වර්ෂයේ කිරි ගවයින් 20,000 ක් ආනයනය කිරීම සඳහා 2015 වර්ෂයේ සිදු කර ඇති ශක්‍යතා වාර්තාවේ ඇගයීම අනුව ආහාර වියදම කිරි ආදායමින් සියයට 57.38 ප්‍රතිශතයක් ලෙස ගණනය කර තිබුණි. එසේ වුවද පශු සම්පත් මණ්ඩලයේ ගොවිපළවල තත්‍ය ආහාර වියදම කිරි ආදායමෙන් සියයට **69** ක සිට සියයට **89.71** ක පරාසයක් ප්‍රතිශතයක් ගෙන තිබුණි. | විශේෂයෙන් මෙවැනි පිරිවැය අධික ව්‍යාපෘති සඳහා තාත්වික හා නිවැරදි තොරතුරු මගින් විශේෂඥ ඥාණය යොදවා නිවැරදි හා ස්වාධීන සක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කර සීමිත සම්පතක් වන රාජයේ ප්‍රතිපාදන වලින් උපරිම ඵලදාව ලබාගැනීමට කටයුතු කල යුතු වීම. | නිරවද්‍ය නොවේ. |
| (ඈ) | උක්ත ශක්‍යතා වාර්තාවට අනුව පළමු වසරේ ක්ෂීරණයකදී ලබාගත හැකි දෛනික නිෂ්පාදනය දිනකට ලීටර් 18 ක් හා දෙවන වසරේ දිනකට ලීටර් 19.5 ක් විය යුතු යැයි දක්වා තිබුණි. එසේ වුවද, පශු සම්පත් මණ්ඩලය ආනයනය කළ සතුන්ගෙන් පළමු වසරේ | -එම - | මෙම ව්‍යාපෘතිය සම්බන්ධ ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් 2017 වර්ෂයේදී ඉදිරිපත් වී නොමැති අතර, ඒ පිළිබඳව ඉදිරිපත් කොට ඇති කරුණු පැහැදිළි නොමැති බැවින් |

| | | | |
|---|---|---|---|
| | දිනකට උපරිම කිරි ලීටර් **15** ක් හා දෙවන වසරේ දිනකට ලීටර් **16** ක් ලැබී තිබුණි. | | නිශ්චිත පිළිතුරු ලබාදීම සඳහා පැහැදිළිව විමසන්නේ නම් මැනවි. |
| **(ඉ)** | ශක්‍යතා වාර්තාව අනුව කිරිගවයකුගේ ගැබ් ගැනීමේ ප්‍රතිශතය සෑම වර්ෂයකම සියයට 80 ක් බව පෙන්වා ඇත. නමුත් කෘත්‍රිම සිංචනය මඟින් දිවයින තුළ මේ වන විට සිංචන සඵලතාව සියයට 25ක සිට සියයට 30 ක් අතර පරාසයක් විය. | - එම - | තොරතුරු නිරවද්‍ය නොවේ. |
| (ඊ) | 2007 වර්ෂයේ ටෙන්ඩර් කැඳවීම මඟින් අමාත්‍යාංශය යටතේ තිබූ පශු සම්පත් මණ්ඩලයට කිරි ගව ආනයනය සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරුටම නැවත ටෙන්ඩර් කැඳවීම් නොකර ඩොලර් මිලියන 73.95 කට කිරිගවයින් 20,000 ක් ආනයනයට අමාත්‍යාංශය විසින් 2014 ඔක්තෝබර් 14 දින ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම 2016 නොවැම්බර් මස සංශෝධනය කර අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමට නැවත ගිවිසුම් ගතවී පළමු ප්‍රසම්පාදනය අවසන් වී වසර 10 කට පසු 2017 සිට 2020 දක්වා ගවයින් 20,000 ක් ආනයනයට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධි විධාන ප්‍රකාරව ටෙන්ඩර් කැඳවීම මඟින් වැඩි ප්‍රතිලාභයක් ලැබෙන කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම කළ යුතු වීම. | ව්‍යාපෘතිය සැළසුම් කරන ලද්දේ එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වන අතර අදාළ විෂයානුබද්ධ අමාත්‍යාංශය වන පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මඟින් විධිමත් ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් ක්‍රියාවලියක් මත තොරා ගන්නා ලද සැපයුම්කරු වෙතම එම ටෙන්ඩරය ලබා දුන් අතර ඒ සඳහා අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. |

### 3.10.2 ව්‍යාපෘතිය අසාර්ථක වීම නිසා අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා ගැනීම

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

2017 වර්ෂයේ කිරිගව ආනයන ව්‍යාපෘතිය යටතේ පළමු අදියරේදී කිරිගවයන් 1994 ක් හා දෙවන අදියරේදී 3204 ක් ආනයනය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙවන අදියරේ ආනයනය කළ සතුන් 3,024 න් නියැදි වශයෙන් තෝරාගත් සතුන් 858ක් ඇති කරන කිරි ගොවීන් 12 දෙනෙකුගෙන් ලබාගත් වාර්තා අනුව ඔවුන් මාසිකව රු.25,240 සිට රු.මිලියන 5.2 ක් දක්වා පරාසයක් තුල අලාභයන් ලබා තිබුණි. | පශු සම්පත් ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිත විශේෂඥ ඥාණය යොදවා නිවැරදි සක්‍යතා අධ්‍යයන වාර්තා සැකසීමෙන් අනතුරුව රටට ඵලදායී වන ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු වීම. | තොරතුරු පිළිගත නොහැක. |
| (ආ) | පලමුවර ආනයනය කල කිරි ගවයන් 1994 න් | ව්‍යාපෘති ක්‍රියාත්මක | |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තෝරාගත් සතුන් 902ක නියැදියෙන් 2019 පෙබරවාරි 28 දිනට මව් සතුන් 656 ක් පමණක් ජීවත්ව සිටින අතර**,** එම සතුන්ගෙන් පැටවු ලැබී දැනට ගොවිපල තුල ජීවත්ව සිටින්නේ සතුන් 190 ක් පමණි.<br><br>දෙවන වර ආනයනය කළ කිරි ගවයන් **3024** න් 858 ක නියැදියෙන් පළමු වර පැටවු 803 ක් බිහිකර තිබූ අතර එයින් පිරිමි සතුන් 424 ක් එනම් සියයට 53 ක ප්‍රතිශතයක් විය. තවද, බිහි කළ පැටවුන් 803 න් පැටවු 361 ක් එනම් සියයට 45 ක මිය ගොස් තිබුණි. 2019 පෙබරවාරි මාසය වන විට ඉතිරි ආනයන මවු<br><br>සතුන් ගණන 533 ක් වූ අතර එම සතුන්ගෙන් ගැබ් ගත් සතුන් සංඛ්‍යාව 210 ක් එනම් සියයට 39 ක් වන අතර බිහිකළ පැටවුන් ගණන 116 ක් පමණක් බව නිරීක්‍ෂණය විය. | කිරීමට පෙර අදාල විෂයය පිලිබද දැනුම ඇති පුද්ගලයින් යොදා සක්‍යතා අධ්‍යයනයන් සිදු කල යුතු වීමත් ඊට අමතරව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී හා නිසි අධීක්ෂණයන් සිදු කොට ගොවීන් මුහුණපාන ගැටළු හා ප්‍රශ්න පිළිබඳව අඛණ්ඩව නිලධාරීන්ගේ අධීක්‍ෂණයට හා ඇගයීමට යොමු කිරීම හා අවශ්‍ය තොරතුරු නිසි පරිදි ලේඛනගත කර අවශ්‍ය සෑම තොරතුරකටම අදාල දත්ත ගබඩා කර දත්ත පද්ධතියක් පවත්වා ගත යුතු වීම හා ගොවීන්ට අවශ්‍ය උපදෙස් නිසි පරිදි නිසි කලට ලබාදීම කළ යුතු වීම. | මෙම ගොවීන් විසින් සපයන තොරතුරු නිරවද්‍ය නොවේ. |
| (ඈ) | ගවයින් ආනයනය සඳහා ඇ.ඩො 16,739,589.77ක මුදලින් ඇ.ඩො 868,518.52 ක් එනම් රු.135,011,204 ක් තාක්ෂණික කළමනාකරණය සහ ධාරිතා වර්ධනය සඳහා විය ඉහත කරුණුවලට අනුව එම නියෝජිත ආයතනය මගින් තාක්‍ෂණික කළමනාකරණය නියමාකාරයෙන් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය. | පශු සම්පත් ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිත කණ්ඩායමක් මගින් ක්‍රමවත් අධ්‍යයනයක් සිදුකොට දීර්ඝ කාලීන සැලසුම් පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ හෝ අමාත්‍යාංශය යටතේ සකස් කිරීමට කටයුතු කල යුතුය. | තොරතුරු සත්‍ය නොවේ. |
| (ඉ) | කිරි නිෂ්පාදනය වැඩි කිරීම මඟින් කිරිපිටි ආනයනය අඩුකිරීමට හා දියර කිරි පරිභෝජනය වැඩිකිරීමට කිරි ගවයන් ආනයන ව්‍යාපෘතිය යටතේ 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු. මිලියන **6**,435 ක විදේශ ණය ලබා ගෙන ගවයින් 9,500 ක් ආනයනය කර පශු සම්පත් මණ්ඩලයට හා අමාත්‍යාංශය යටතේ පෞද්ගලික ගොවීන් වෙත බෙදා හැර තිබුණි. එසේ වුවද, 2011 වර්ෂයේදී ආනයනික කිරිපිටි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 84.02 ක්, ක් වුවද එය **2018** වර්ෂයේදී මෙට්‍රික් ටොන් 99.03ක් දක්වා වැඩිවී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ ඉටුවී නොතිබුණි. | කිරි ගවයින් ආනයනය කිරීමට සමගාමීව, දියර කිරි පරිභෝජනය වැඩිකිරීමට හා කිරි පිටි ආනයනය අඩු කිරීමට ප්‍රතිපත්ති සකස් විය යුතු වීම. | තොරතුරු නිරවද්‍ය නොවේ |

**3.10.3** මහජනතාවට හා රටට අයහපත් අයුරින් අනාරක්ෂිතව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගෙ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1992 අංක 59 දරන සත්ව රෝග පනතේ 28 වගන්තියට අනුව රට තුළට එන සෑම සතෙකුම නිරෝධායන පරීක්‍ෂාවට ලක් කළ යුතු වුවත්, එසේ සිදු නොකොට නියැදියක් පමණක් නිරෝධායන පරීක්‍ෂාවට ලක් කිරීමෙන් පනතට පටහැනිව කටයුතු කළ බව නිරීක්‍ෂණය විය. මෙම ආනයනයේදී නිරෝධායනයන් මඟින් අනාවරණය කර නොතිබූ රටේ නොමැති බී.වී.ඩී. වෛරසය ශරීරගතවී ඇති බව ආනයනික කිරිගව පශ්චාත් මරණ පරීක්‍ෂණයන්ගෙන් අනාවරණය විය. | පනත අනුව කටයුතු කළ යුතු වීම. | නිරවද්‍ය නොවේ. |
| (ආ) | 2017 වර්ෂයේ ආනයනය කල කිරි ගවයින් 1,994 හා 3,024 ක් පිළිබඳව ප්‍රධාන සත්ව නිරෝධායන නිලධාරී සහ පශු වෛද්‍ය පර්යේෂණ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කර තිබූ නිරෝධායන වාර්තාවට අනුව එම සතුන්ගෙන් නියැදියක් පරීක්ෂා කොට සතුන් සතු රෝග කාරක දේශීය ගවයින් වෙත සහ මනුෂ්‍යයන් වෙතද බෝවීමේ අවධානමක් ඇති බව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණි. | ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිත කණ්ඩායමක් මගින් ක්‍රමවත් අධ්‍යයනයක් සිදුකොට රටට හා මහජනතාවට හානියක් නොවන අයුරින් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වීම. | අදාළ කටයුතු සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකර ඇත. |

### 3.10.4 ව්‍යාපෘතියේ සිදුවූ අලාභය හා පාඩු

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ අසාර්ථකත්වය හේතුවෙන් 2018 වර්ෂයේ ආනයනයට නියමිත සතුන් 2500 ක් 2019 අගෝස්තු දක්වාම ආනයනය නැවත්වීමට සිදුවී තිබුණි. මේ තත්ත්වය මත 2018, 2019 හා 2020 වර්ෂවලදී ගෙන්වීමට නියමිත කිරි ගවයින් ප්‍රමාණය පිළිවෙලින් 2,500, ක් 7,500 ක් හා 5,000 ක් සඳහා 2018 මැයි මාසයේදී ගෙවා ඇති අත්තිකාරම් මුදල පිළිවෙලින් රු. මිලියන 291.61 ක් , රු. මිලියන 874.83 ක් හා රු.මිලියන 583.22 ක් ලෙස එකතුව රු.මිලියන 1,749.67 ක් විය. තවද එම මුදල් සඳහා පොලිය සහ විදේශ විනිමය අවප්‍රමාණය වීමේ අලාභය ඉදිරියේදී දැරීමට සිදුවන බව පෙන්වා දෙනු කැමැත්තෙමි. | තිරසාර සංවර්ධනයට අනුගතවීමට පශු සම්පත් ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිත කණ්ඩායමක් මගින් ක්‍රමවත් අධ්‍යයනයක් සිදුකොට දීර්ඝ කාලීන සැලසුම් පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ හෝ අමාත්‍යාංශය යටතේ සකස් කිරීමට කටයුතු කිරීම සුදුසු බව. | මෙම ව්‍යාපෘතිය අසාර්ථක ලෙස කිසිසේත් දැක්විය නොහැකි අතර ව්‍යාපෘතියට සම්බන් ගොවීන් සහ බාහිර පාර්ශවයන් විසින් තවදුරට රජයෙන් සහන ලබා ගැනීමේ අරමුණින් ගෙ යන අනර්ථකාරී උත්සාහයන් නිසා ව්‍යාපෘති අසාර්ථක ලෙස පෙන්නුම් කර ඇත. නිසි උපදෙ පරිදි ගොවිපල කළමණාකරණය කර ගොවිපල අපේක්ෂිත ප්‍රතිඵල ලබා ඇති අත එකම වර්ගයේ සතුන් විවිධ ගොවිපල ව සාර්ථක අසාර්ථක වීම කළමනාකරණ දූර්වලතාවයක් බව පැහැදිලිය. එමෙන්ම**,** රජ මඟින් **6%**ක සහන පොළියක්ද එක් සත වෙනුවෙන් රු.**267,000** ක් ද අනෙකුත් අවශ සේවාවන් ද සම්පාදනය කර ඇති අතර මේ සිය ප්‍රතිලාභ ලබමින් තම ගොවිපලේ සත්‍ය තොරතුරු සඟවා රජයෙන් තවදුරටත් ලාභ ල ගැනීමට උත්සහ කරන ගොවීන් පිරිසක්ද ෙ තුළ වෙති. |
| (ආ) | වේලාඬ් ආයතනය විසින් ලබාදුන් රෝගී සතුන් 10 දෙනෙකු වෙනුවෙන් ගලේවෙල ගොවිපලක අයිතිකරුවකු වෙත ගොවියා ගෙවූ වටිනාකම වන රු. මිලියන 2ක් ගොවියාට නැවත ලබා දී තිබුණද, එම සතුන් සඳහා රජය වැය කල රු. මිලියන 3.21 ක මුදල රජයට අලාභයක් වී ඇති අතර එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රජය වැය කළ නමුත් රජයට අලාභයක් වූ මුදල අදාළ පාර්ශවයන්ගෙන් අයකරගත යුතු වීම. | එම ගොවිපල් කරු මුලින් ඉල්ලුම් ක ප්‍රතිලාභියකු නොවන අතර මැණික්පාල ගොවිපළෙහි රඳවා සිටි ඉතිරි සතුන් ඔහුගෙ අනුදැනුම මත ලබා ගත් අයෙකි. ඔහුගේ ඉල්ලී මත නැවත පරීක්ෂා කර බැලීමෙන් අනතුරු මාගේ ඉල්ලීමක් මත වේලාඬ් ආයතනය එ මුදල ගොවියාට ගෙවූ අතර එම සතු ආනයනයෙන් පසු ගැටළු ඇති වූ සතුන් බැවි රජයට ගෙවීමක් සිදු කළ නොහැක. එම සතුන් එම ගොවි මහතාට ලබා දෙන ලදි. |

## 4. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහ දැක්වීම** |
|---|---|---|
| ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය තම අමාත්‍යාංශයට අයත් ආයතන සඳහා අරමුණු වශයෙන් දුගී බව නැති කිරීම, සාගින්න තුරන් කිරීම සහ යහපත් වැඩ පරිසරයක් | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට හැකි වන පරිදි සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු කල යුතුය. | පිළිතුරු ලබා දී නොමැත |

තුළින් ආර්ථික සංවර්ධනයක් වශයෙන් හදුන්වා දී තිබුණි. එසේ වුවද, පශු සම්පත් මණ්ඩලය එම අරමුණු අතරින් තම නිෂ්පාදනය තුලින් සාගින්න තුරන් කිරීම හා පෝෂණය නැංවීමේ අරමුණ හදුනාගෙන නොතිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පත්වීම් බලධාරියාගේ අනුමැතියකින් තොරව ලේකම් විසින් 2013 ජුනි මාසයේ සිට 2014 මාර්තු අතර පරිච්ඡේදය තුළ වී අලෙවි මණ්ඩලයට මුදාහැර තිබු සංවර්ධන නිලධාරීන් 27 දෙනෙකුගෙන් 26 දෙනෙකුට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අමාත්‍යාංශයේ සේවයට වාර්තා කර නොතිබුණි. තවද තාවකාලිකව මුදා හැරීමේදී විශ්‍රාම දායක මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද, එසේ අඩුකර ගැනීමක් සිදු නොකර 2016 හා 2017 වර්ෂ වල ගෙවන ලද සම්පූර්ණ වැටුප රු. මිලියන 24.30 ක්ම ප්‍රතිපූර්ණය කර තිබුණි. | ආයතන සංග්‍රහයේ **v** වන පරිච්ඡේදයේ අංක 2.5.1 වගන්තිය ප්‍රකාරව කටයුතුකල යුතු වීම. | එවකට වී අලෙවි මණ්ඩලය මෙම අමාත්‍යාංශය යටතේ තිබූ ආයතනයක් වූ බැවින් අමාත්‍යාංශ සම්බන්ධීකරණ රාජකාරී වෙනුවෙන් මෙම නිලධාරීන් වී අලෙවි මණ්ඩලය වෙත අනුයුක්ත කර ඇත. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට අනුමත 666 ක තනතුරු සංඛ්‍යාවෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක් ඇතුළුව තනතුරු 33 ක පුරප්පාඩුවක් පැවතිණි. | රාජකාරී නිසි පරිදි ඉටු කිරීමට ප්‍රමාණවත් සේවක පිරිසක් අමාත්‍යාංශය තුල රඳවා ගැනීමට සියලු පුරප්පාඩු සඳහා හැකි ඉක්මනින් සේවකයින් බඳවා ගැනීම කළ යුතු වීම. | මාණ්ඩලික නිලධාරි තනතුරු පුරප්පාඩු 9 ඇතුලත බහුතර පුරප්පාඩු සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය විසින් නිලධාරින් ලබා ගත යුතු වූ තනතුරු වන බැවින් එම පුරප්පාඩු පුරවන ලෙස එම අමාත්‍යංශයෙන් ඉල්ලා ඇත. එහෙත් සමහර තනතුරු සඳහා වැඩ බැලීමේ පත්කිරිම් සිදු කර ඇත. |